# දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය

## පුරප්පාඩු - කළමනාකරණ සහකාර තනතුර (පොත් තබන්නා) ශ්‍රේණිය III

කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIIM) පවතින කළමනාකරණ සහකාර (පොත් තබන්නා) III ශ්‍රේණිය තනතුර පුරප්පාඩුව පිරවීම සඳහා තිසිලෙස සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් 2025.05.26 දරන දින අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් :**

(01) අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් එක් වරකදී පහත විෂයන්හට සම්මාන සහිතව විෂයයන් හයකින් (06) එක වරකදී සමත් විය යුතුය.

i. සිංහල භාෂාව / දෙමළ භාෂාව

ii. ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍ය

iii. ගණිතය

**සහ**

(02) අ.පො.ස (උ/පෙළ) විභාගය සියලු විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රය හැර) එක වරකදී සමත් වී තිබීම

**සැ.යු :** පහත සුදුසුකම් සහිත අයදුම්කරුවන්හට ප්‍රමුඛතාවය හිමි වනු ඇත.

(අ) පරිගණක යෙදවුම් පිළිබඳ මාස හයකට නොඅඩු කාලයකින් (06) පිළිගත් ආයතනයකින් ලබාගත් පිළිගත හැකි සුදුසුකමක්.

**සහ**

(ආ) පරිගණක යෙදවුම් පැකේජ භාවිතය පිළිබඳ අවුරුදු දෙකක පළපුරුද්ද

**තනතුරට සිවිශේෂී වූ සුදුසුකම් :**

(අ) තිපුණතා සංවර්ධන හා වෘත්තිය පුහුණු අමාත්‍යාංශය යටතේ පවතින ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයකින්/ තාක්ෂණ විද්‍යාලකින් ලබාගත් ගිණුම්කරණ හා තාක්‍ෂණ ශිල්පී ජාතික සහතිකය හෝ පිළිගත් ආයතනයකින් ලබාගත් වෙනත් ඒ හා සමාන සුදුසුකමක්

**හෝ**

(ආ) අ.පො.ස (උසස් පෙළ) වාණිජ්‍ය විෂය ධාරාවෙන් සමත් වී තිබීම.

(අ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

(ඇ) මනා චරිතයකින් යුක්ත විය යුතුය.

**තෝරාගැනීම** : ලිඛිත පරීක්ෂණයකින් හා සම්මුඛ පරීක්ෂණයකින්

**වැටුප් පරිමාව** : U MN 1(III) රු. 49,475-17X540-58,655 (මාසිකව) 2025.01.01 දිනට

**ප්‍රතිලාභ**

01. තොරාගත් අයදුම්කරු විසින් ඔහු/ ඇයගේ මාසික මූලික වැටුපෙන් 10% කට සමාන ප්‍රතිශතයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන අරමුදලට දායකත්වයක් හිමි වීම. ඒ හා සමානව විශ්වවිද්‍යාලය විසින් එහි අරමුදල්වලින් ඔහුගේ/ ඇයගේ ඉපයීම්වලින් (7%) කට සමාන මුදලක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන අරමුලට හා ඔහුගේ/ ඇයගේ ඉපයීම්වලින් (8%)කට සමාන මුදලක් විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදලට දායක කිරීම.

02. ඔහුගේ/ ඇයගේ මූලික වැටුපෙන් සියයට තුනක (3%) ප්‍රතිශතයක් සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට, සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලේ ප්‍රතිපාදන අනුව විශ්වවිද්‍යාලය විසින් බැරකරනු ලැබේ.

03. ඉහත සඳහන් වැටුපට අමතරව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අනුමත ජීවන වියදම් දීමනාව හා වෙනත් දීමනා අදාළ පරිදි ගෙවනු ලැබේ.

**අයදුම්කරන ආකාරය**

අයදුම්පත්‍රය හා අදාළ විස්තර දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වෙබ් අඩවිය වන **https://pgiimed.cmb.ac.lk** වෙතින් භාගත කළ හැක.

අදාළ අධ්‍යාපන සහතික, වෘත්තිය සහතික හා සේවා සහතිකවල සහතික කරන ලද පිටපත් සමග නිසි පරිදි සම්පූර්ණ කරන ලද, අයදුම්පත් **"ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, 5 වන මහල, ආයුර්වේද ශික්ෂණ රෝහල, කොටා පාර, බොරැල්ල වෙත 2025.05.26 දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපැලෙන් යොමුකළ යුතුය."** ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

විශ්වවිද්‍යාල පද්ධතියේ/ රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන්ගේ අයදුම්පත් අදාළ අංශ ප්‍රධානීන් මගින් යොමුකළ යුතුය.

ඉහත අවශ්‍යතා සපුරා නොමැති අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාරගන්නා අවසාන දිනෙන් පසුව එවනු ලබන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අධ්‍යක්ෂ,**
**දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.**